1984 යල කන්නයේදී වී වගාව සඳහා සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ රුපියල් භාර කෝටි දෙලක්ෂයක ණය දී ඇත. මෙය ඉකුත් යල කන්නය සඳහා දෙන ලද ණය ප්‍රමාණයට වඩා සියයට 41 ක වැඩිවීමකි. මෙයට හේතුව වූයේ ලංකා බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව විසින් වාර්තා කර ඇති සැළකිය යුතු වැඩිවීමයි. යල කන්නයේ වී වගාව සඳහා මහජන බැංකුව විසින් දෙන ලද ණය ප්‍රමාණය ඉකුත් යල කන්නයේ දුන් ප්‍රමාණයට බොහෝදුරට සමාන විය.

1984 වගා වර්ෂය තුළදී අතුරු ආහාර භෝග වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් භාර කෝටි හත් ලක්ෂය දක්වා ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 43 කින් වැඩිවිය. මෙම වැඩිවීමෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයකට මහජන බැංකුව දයක වූ අතර, අතුරු ආහාර භෝග වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණයෙහි මහජන බැංකුවේ සාපේක්ෂ කොටස 1983 දී සියයට 24 සිට 1984 දී සියයට 31 දක්වා වැඩිවිය.

සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ දෙන ලද වගාණය ආපසු අයකර ගැනීම 1984 වර්ෂය තුළදී පිරිහීමක් පෙන්විය. 1983/84 මහ කන්නය සඳහා දෙන ලද මුළු වී වගා ණය ප්‍රමාණයෙන් 1984 වර්ෂය අවසානය වන විට ආපසු අයකර ගෙන තිබුණේ සියයට 64 ක් පමණි. එහෙත් 1982/83 මහ කන්නයේ වී වගා ණය ප්‍රමාණයෙන් සියයට 73 ක් 1983 වර්ෂය අවසානය වනවිට අය කරගෙන තිබිණි. මෙම ආපසු අය කර ගැනීමේ දුර්වලතාවය සහභාගි වන සියළුම බැංකු සම්බන්ධයෙන් දක්නට ලැබිණි. මහ කන්නයේ වී වගා ණය ආපසු අයකර ගැනීමෙහිදී දක්නට ලැබුණු මෙම සාපේක්ෂ දුර්වල ක්‍රියාකාරිත්වයට බොහෝදුරට හේතු වූයේ වගා ප්‍රදේශ බොහොමයකම ගංවතුර සහ අධික වර්ෂාව නිසා වගා පාළුවීමය.

1977 ජනවාරි 1 වැනි දින සිට 1981 ජූනි 30 දක්වා දෙන ලද වගා ණය බේරීමේ කාලය නැවත දීර්ඝ කිරීම පිළිබඳ ක්‍රමයේ ප්‍රගතිය 1984 වර්ෂයේදී තවදුරටත් දුර්වල තත්ත්වයක පැවතිණි. 1984 වර්ෂය තුළදී වුවමනාවෙන් ණය පැහැර හැරි පුද්ගලයන් විශාල සංඛ්‍යාවකට විරුද්ධව ලංකා බැංකුව විසින් නීති මගින් කටයුතු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය තුළදී එකී ණය පැහැර හැරි පුද්ගලයන්ගෙන් රුපියල් 30 ලක්ෂයක් අයකර ගැනීමට බැංකුවට හැකිවිය.

ග්‍රාමීය ණය ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදක මණ්ඩලය වන ග්‍රාමීය ණය උපදේශක මණ්ඩලය වර්ෂය තුළදී රැස්වීම් වාර කිහිපයක්ම පැවැත්වීය. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවීම සඳහා වූ ව්‍යවස්ථා කෙටුම්පත් සම්පාදනය වර්ෂය තුළදී අවසන් කරන ලදී. මහ බැංකුවේ මාතර සහ අනුරාධපුර ශාඛාවන් විසින් ග්‍රාමීය සංවර්ධන කටයුතු නඟා සිටුවීම පිණිස විශේෂ ග්‍රාමීය ණය සැපයීමේ වැඩපිළිවෙලවල් නොකඩවා කරගෙන යනු ලැබීය.[1]

## කර්මාන්ත[2]

පසුගිය පස්වසර හා සැසඳීමේ දී 1984 වර්ෂයේ දී කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය සමස්ත වශයෙන් සැළකියයුතු දියුණුවක් පෙන්නුම් කළේය. ඉහළ වර්ධන අනුපාතිකය, සීඝ්‍ර ලෙසින් අපනයන කටයුතු ප්‍රසාරණයවීම, ඇහලුම් කර්මාන්ත අංශයේ ආයෝජනය සඳහා අවධාරණය අළුත්වීම සහ ආයෝජකයන්ගේ විශ්වාසය යළිත් පණගැන්වීම තුළින් එය පිළිබිඹු විය. පසුගිය දශකය තුළ ඉහළම වර්ධන අනුපාතයක් වාර්තා කරමින් කර්මාන්ත අංශයේ නිමැවුම මූර්ත වශයෙන් සියයට 15 කින් වැඩිවීයයි ඇස්තමේන්තු කර ඇත. වර්ෂය තුළදී

1. මහ බැංකුවේ ග්‍රාමීය ණය කටයුතු පිළිබඳවද මහ බැංකුවේ මාතර සහ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල දෙකෙහි කටයුතු පිළිබඳවද වැඩි විස්තර මෙම වාර්තාවේ **XX - XXIV, XXIV - XXVII** වැනි පිටුවල දක්වා ඇත.

2. පසුගිය වර්ෂවලදී මෙන්ම 1984 වර්ෂයේදීද කර්මාන්ත අංශයේ ප්‍රගතිය පිළිබඳ දත්තයන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි ලොකු, මධ්‍යම සහ කුඩා සියළුම වාර්තාගත සහ ප්‍රසිද්ධ නිමැවුම් කර්මාන්තයන් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව මගින් යවන ලද ප්‍රශ්නාවලියකට ලැබුණු පිළිතුරු මත පදනම් වී ඇත. (කෙසේ වුවද, ජාතික ආදයම ගණනය කිරීමේදී, කාර්මික නිෂ්පාදන ක්‍රියාවලියක් ලෙස වර්ග කරනු ලබන වැවිලි කර්මාන්තයට සම්බන්ධ අපනයන සැකසුම් කටයුතු මීට ඇතුළත් කර නැත.) පොදුවේ ගත් කල, ආමන්ත්‍රිත ආයතනයන්ගෙන් තුනෙන් පංගුවකින් පමණ පිළිතුරු ලැබුණ අතර ඒවායින් ප්‍රධාන කර්මාන්ත සියල්ලම පාහේ නියෝජනය විය. දත්තයන් ලබාගත නොහැකි වූ අංශයන් පිළිබඳව, විවිධ රාජ්‍ය ආයතනයන් හා සංවිධානයන්ගෙන් ලබාගත හැකි වූ තොරතුරු පදනම්කොට කැරුණු ඇස්තමේන්තු ප්‍රයෝජනයට ගනු ලැබිණ.

පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි වඩා සාර්ථක ක්‍රියාකාරිත්වය මෙම වර්ධනයට එක් හේතුවක් විය. එසේම, කාර්මික අපනයනයන්හි ද සියයට 43 ක (විගැහි සියයට 38 ක) පැහැදිලි වැඩිවීමක් දක්නට ලැබුණි.

1984 සිසු කාර්මික වර්ධනය, පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි සියයට 26 ක සහ රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි සියයට 7 ක වර්ධනයකින් සමන්විත විය. ඉකුත් වසරේ පහළ නිමැවුමක් වාර්තා කළ රාජ්‍ය අංශයේ කර්මාන්ත, 1984 දී ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය. මීට ප්‍රධාන හේතුව රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙන් සියයට 55 කට වගකියන තෙල් පිරිපහදුවේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයයි. තෙල් පිරිපහදුව සහ රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තය මුළු කාර්මික නිමැවුමෙන් වැඩි කොටසකට වගකියන හෙයින් කර්මාන්ත අංශයේ වර්ධනය මෙම අංශයන්හි ක්‍රියාකාරිත්වය මගින් බොහෝ දුරට තීරණය වෙයි. එබැවින්, දේශීය එකතු කළ අගයේ වටිනාකම අනුව බලන කල අන්‍යෝන්‍ය වශයෙන් පහත් මට්ටමක දායකත්වයක් ඇති කර්මාන්ත දෙකකට කාර්මික අංශයේ ආර්ථික සෞභාග්‍යය පැවරීම ප්‍රඥාගෝචර නොවන නිසා කාර්මික නිෂ්පාදනයේ විවිධාංගීකරණයට ප්‍රතිපත්තිමය අවධානයක් යොමු කිරීම අවශ්‍ය බව පෙනී යයි.

1977 සිට ක්‍රියාත්මක වූ ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීමේ අදහසින්, කර්මාන්ත අංශය හා සම්බන්ධ ප්‍රතිපත්තීන්හි වෙනස්කම් කිහිපයක් විමසුමට ලක්වූ වර්ෂය තුළදී හඳුන්වා දෙන ලදී. අපනයනාභිමුඛ කර්මාන්තයන් දිරිගැන්වීම මෙම වෙනස්කම්හි අරමුණ වූ අතර, ආනයන ආදේශන කර්මාන්තයන්ට මෙයින් ප්‍රමාණවත් ආරක්ෂණයක් ද සැපයිණ. 1985 වර්ෂය සඳහා වූ අයවැයෙන්, ඇතැම් සම්ප්‍රදායික නොවන අපනයන කර්මාන්ත සඳහා තවදුරටත් අවුරුදු 10 ක අර්ධ–බදු විරාමයක් ලබාදුණි. මෙම සහන සැලසීම සකස් කර තිබෙන්නේ, විශේෂයෙන් දේශීය අමුද්‍රව්‍ය පදනම් කරගන්නා කර්මාන්ත සහ දේශීය වශයෙන් එකතු වූ අගය වැඩි කර්මාන්ත දිරිගැන්වීම සඳහා ය. තවද, ග්‍රාමීය කර්මාන්ත අංශය දියුණු කිරීමේ අරමුණින් සහ ග්‍රාමීය අංශයේ වැඩිපුර සේවා නියුක්ති ඉඩ ප්‍රස්ථා කිරීමේ අරමුණින් කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත, පුද්ගලයින් 25 කට වඩා රැකියාවේ නියුතු නව ශ්‍රම සූක්ෂම කර්මාන්ත ආරම්භ කරන සමාගම්හි කොටස් මිළදී ගැනීම සඳහා ආයෝජකයාගේ තක්සේරු ආදායමෙන් තුනෙන් එකක් දක්වා ආයෝජන සහන සැපයිණි.

විමසුමට ලක් කළ වසර තුළ පැහැදිලි තීරුබදු වෙනස්කම් කිහිපයක් හඳුන්වා දෙනු ලැබිය. ජනාධිපති තීරුබදු කොමිසමේ යෝජනා පරිදි ආනයන බදු ව්‍යුහය ප්‍රතිශෝධනය කරන ලදී. මෙම කොමිසම සඵල ආරක්ෂණ මට්ටම් පදනම් කොට තීරුබදු වෙනස්කම් නිර්දේශ කරන ලද්දේ, සාධාරණ තීරුබදු ව්‍යුහයක් තුළින් දේශීය කර්මාන්ත අතර සඵල ආරක්ෂණ මට්ටම් පිළිබඳ අසමානකම් අඩු කිරීමේ අරමුණ ඇතිවය. අපනයනය සඳහා නිෂ්පාදනය කිරීමට එරෙහිව ඇති ආකල්පය ඉවත් කිරීම මගින් දේශීය නිෂ්පාදනය උනන්දු කරවීම මෙම නව තීරුබදු ප්‍රතිසංස්කරණයන්හි අරමුණ විය.

**ආයෝජන**

කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය, ජෙෂ කර්මාන්ත අමාත්‍යාංශය සහ ධීවර අමාත්‍යාංශය හා අනුයුක්ත දේශීය ආයෝජන උපදේශක කමිටු (දේ. ආ. උ. ක.) මගින් ආයෝජන ක්ෂේත්‍රය තුළ, 1984 දී කාර්මික ව්‍යාපෘතීන් 474 ක් අනුමත කර ඇති අතර, 1983 වර්ෂය හා සසඳා බැලීමේදී එම වර්ෂයේ අනුමත කර ඇත්තේ ව්‍යාපෘතීන් 349 කි. මෙම ව්‍යාපෘතීන්හි අපේක්ෂිත ආයෝජනය රුපියල් 56 කෝටි 70 ලක්ෂයක් වන අතර, එමගින් ආසන්න වශයෙන් පුද්ගලයන් 21,524 දෙනෙකුට රැකියා සැපයේ යැයි අපේක්ෂා කෙරේ. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය හා අනුබද්ධ වූ ග්‍රාමීය කර්මාන්ත උපදේශක කමිටුව (ග්‍රා. ක. උ. ක.) විසින් රුපියල් එක් කෝටි පන්ලක්ෂයක අපේක්ෂිත ආයෝජනයක් සහිත ව්‍යාපෘතීන් 3 ක් 1984 දී අනුමත කෙරුණි.

1984 වර්ෂයේ දී විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි. ආ. උ. ක.) මගින් ව්‍යාපෘතීන් 41 ක් සඳහා අනුමැතිය දී තිබුණු අතර, එයින් අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් 128 කෝටි 30 ලක්ෂයක් විය. එහි විදේශීය කොටස රුපියල් 52 කෝටි 20 ලක්ෂයක් විය. මෙම ව්‍යාපෘතීන්හි මුළු අපේක්ෂිත සේවා නියුක්ති සංඛ්‍යාව 8,785 ක් යැයි ඇස්තමේන්තු කර ඇත. අනුමත කරන ලද මුළු ව්‍යාපෘතීන් සංඛ්‍යාවෙන්, 14 ක් රෙදිපිළි සහ මසා නිමකළ ඇඳුම් අංශයෙහි විය. මහ කොළඹ ආර්ථික කොමිසම (ම. කො. ආ. කො.) විසින් රුපියල් 67 කෝටි 80 ලක්ෂයක අපේක්ෂිත ආයෝජනයක් සහිත ව්‍යාපෘතීන් 15 ක් අනුමත කර ඇති අතර එහි වැඩි වීම පසුගිය වර්ෂය හා සසඳා බලන විට දෙගුණයක් පමණවේ. වර්ෂය අවසන් වන විට ම. කො. ආ. කො. විසින් ව්‍යාපෘතීන් 199 ක් අනුමත කර තිබුණි. මේවා අතුරින් ව්‍යවසායයන් 112 ක් විවිධ කර්මාන්ත පිහිටුවීම සඳහා ම. කො. ආ. කො. සමග ගිවිසුම් අත්සන් කොට ඇත.

**නිෂ්පාදනය**

පසුගිය වර්ෂයේ සියයට 2 ක වර්ධනයට සාපේක්ෂව, 1984 වර්ෂයේ සමස්ත කාර්මික නිමැවුමෙහි සියයට 15 ක සැලකියයුතු වැඩිවීමක් වූ බවට ඇස්තමේන්තු කර ඇත. මෙම ඉහළ වර්ධන අනුපාතිකය පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි සියයට 26 ක වර්ධනය හා රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි සියයට 7 ක වර්ධනයේ ප්‍රතිඵලයකි. ඛනිජ තෙල් සංස්ථාවේ නිමැවුම හැර රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සමස්ත කාර්මික නිෂ්පාදනය සියයට 9 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 44 කින්), සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 24 කින්), රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 18 කින්), කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත (සියයට 12 කින්) සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 3 කින්) යන කාර්මික උප අංශයන් නිෂ්පාදනයේ වැඩිවීම් වාර්තා කර ඇත. අනෙක් අතට, මූලික ලෝහ නිෂ්පාදිත නිමැවුම සියයට 31 කින්ද, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත නිමැවුම සියයට 9 කින්ද. දැව හා දැව නිෂ්පාදිත නිමැවුම සියයට 8 කින් ද පහත වැටුණි.

**1 . 16 සංඛ්‍යා සටහන**

**කාර්මික නිෂ්පාදන වටිනාකම 1980—1984**

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | 1980 | 1981 | 1982 | 1983 | 1984 (අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පානවර්ග සහ දුම්කොළ .. | 3,899 | 4,496 | 5,246 | 6,998 | 8,623 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 1,923 | 3,040 | 3,863 | 5,136 | 7,565 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 289 | 315 | 361 | 522 | 640 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 476 | 626 | 725 | 901 | 907 |
| 5. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 9,416 | 12,015 | 13,099 | 11,888 | 14,328 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හා ගල් අඟුරු හැර) .. | 1,156 | 1,250 | 1,370 | 1,468 | 1,829 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 478 | 428 | 262 | 302 | 199 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ .. | 620 | 782 | 904 | 1,129 | 1,456 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) .. | 54 | 58 | 74 | 90 | 106 |
| එකතුව .. | 18,311 | 23,010 | 25,904 | 28,434 | 35,653 |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

වර්තන වටිනාකම් අනුව, 1983 වර්ෂයේ වූ සියයට 10 ක වර්ධනයට සාපේක්ෂව 1984 වර්ෂයේ දී සමස්ත කාර්මික නිෂ්පාදනය සියයට 25 කින් වැඩි වී ඇත. ඛනිජ තෙල් නිෂ්පාදිත හැර, අනෙකුත් කාර්මික නිෂ්පාදිතයන් ගේ වටිනාකම සියයට 21 කින් වර්ධනය වී ඇත. මෙය ප්‍රධාන වශයෙන් ම රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් අංශයෙහි විශේෂයෙන් ආයෝජන ප්‍රවර්ධන කලාපයේ (ආ. ප්‍ර. ක.) ඇති අපනයනාභිමුඛ ඇඟළුම් කර්මාන්තයන්හි සහ ජාතික පේෂ කර්ම සංස්ථාවේ පෙහෙකම්හල්හි නිමැවුමෙ විශාල පරිමාණයේ වැඩිවීම්වල ප්‍රතිඵලයකි. රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් නිෂ්පාදිතයන්හි වටිනාකම සියයට 47 කින් වැඩි වී ඇති බව ඇස්තමේන්තු කර ඇත. සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 29 කින්), ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත (සියයට 23 කින්), දැව හා දැව නිෂ්පාදිත (සියයට 23 කින්), ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 25 කින්) සහ රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල් සහ රබර් නිෂ්පාදිත (සියයට 21 කින්) යන අංශයන්හි නිමැවුම් විශාල ලෙස වැඩි වූ බව වාර්තා වෙයි. මූලික ලෝහ නිෂ්පාදිතයන්ගේ නිමැවුම සියයට 34 කින් පහත වැටුණි.

**බලශක්ති සහ ඉන්ධන**

1984 වර්ෂයේ කර්මාන්ත ක්ෂේත්‍රයේ බලශක්ති හා ඉන්ධන පාවිච්චිය සලකා බලනවිට කැපී පෙනෙන කරුණක් වන්නේ කාර්මික ඉන්ධන පාරිභෝජනය (සියයට 46 කින්) සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ වැටීමයි. කෙසේ වතුදු, මෙම පහත වැටීම ලංකා විදුලිබල මණ්ඩලය (ලං. වි. ම.) සිය තාප බල උත්පාදනය අඩු කිරීමේ හේතුවෙන් බැර ඩීසල් හා උදුන් තෙල් අඩුවෙන් පාවිච්චි කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැකිය.

**1 . 17 සංඛ්‍යා සටහන**

**කර්මාන්තවල බල හා ඉන්ධන පාවිච්චිය 1982 – 1984**

| ශීර්ෂය | 1982 | 1983 | 1984 (අ) |
|---|---|---|---|
| 1. විදුලි බලය | | | |
| (ආ) (ගිග වොට් පැය) .. | 739·1 | 752·0 | 788·3 |
| 1·1 කුඩා පරිමාණ කර්මාන්ත .. | 26·0 | 29·0 | 31·5 |
| 1·2 මධ්‍ය පරිමාණ කර්මාන්ත .. | 338·7 | 339·7 | 370·5 |
| 1·3 මහා පරිමාණ කර්මාන්ත .. | 374·3 | 383·3 | 386·3 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය විකුණුම් (මෙ. ටොන් දහස් ගණනින්) .. | 412·2 | 538·6 | 293·5 |
| 2·1 බර ඩීසල් .. | 169·3 | 285·5 | 78·6 |
| 2·2 දැවි තෙල් .. | 242·9 | 253·1 | 214·9 |

මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

(අ) තාවකාලික.

(ආ) කාර්මික නිෂ්පාදන හා අපනයන සැකසුම් කර්මාන්තද ඇතුළත්ය. කුඩා පරිමාණ කර්මාන්ත යනු කිලෝ වෝල්ට් ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයක් ඇති කර්මාන්ත වන අතර, කිලෝ වෝල්ට් ඇම්පියර් 50—500 අතර ඒවා මධ්‍ය පරිමාණ කර්මාන්ත වශයෙන් ද, කිලෝ වෝල්ට් ඇම්පියර් 500 ට වැඩි ඒවා මහා පරිමාණ කර්මාන්ත වශයෙන්ද සැළකේ.

ලංකා විදුලිබල මණ්ඩලයට කරන ලද විකුණුම් හැර, බැර ඩීසල් අලෙවිය 1984 දී සියයට 12 ක වැඩිවීමක් සටහන් කළ අතර, උදුන් තෙල් අලෙවිය 1983 ට වඩා සියයට 1 ක වැඩි වීමක් වාර්තා කළේය. විදුලි බලය, ඉතාම ජාවුල ලෙස භාවිතා වන බලශක්තිය ලෙස තවදුරටත් පැවතුණු අතර, කර්මාන්ත අංශයෙහි විදුලිය භාවිතය සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ දී සියයට 5 කින් වැඩි විය.

### රාජ්‍ය අංශයේ කර්මාන්ත

1984 වර්ෂයේ, රාජ්‍ය අංශයේ කර්මාන්තවල ක්‍රියාකාරිත්වය තුළ සැලකිය යුතු ප්‍රගතීන් කිහිපයක් දක්නට ලැබුණි. 1984 ජනවාරි මාසයේ දී රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ නව උදලු යන්ත්‍රාගාරය ආරම්භ කරන ලදී. ඈත වෙරළේ තෙල් ගවේශණය සඳහා භූ ගර්භ සමීක්ෂණයක් කිරීමට අවශ්‍ය මූල්‍යමය සහ කාර්මික සහාය ලබාගැනීම පිණිස 1984 මාර්තු මාසයේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, (ලං. ඛ. ස.) පෙට්‍රෝ–කැනඩා ජාත්‍යන්තර සහයෝගිතා සංස්ථාව සමග ගිවිසුමකට එළැඹුණි. තවද, ත්‍රිකුණාමලයේ පිහිටි ටැංකි 99 කින් සමන්විත ඛනිජ තෙල් මෙට්‍රික් ටොන් දස ලක්ෂයක මුළු ධාරිතාවයකින් යුතු ටැංකි සංකීර්ණය වැඩි දියුණු කිරීමට හා එය ජාත්‍යන්තර තෙල් ගබඩා සංකීර්ණයක තත්ත්වයට දියුණු කරලීම සඳහා මෙම සංස්ථාව ත්‍රෛජාතික ව්‍යාපාරික කමිටුවක් සමඟ 1984 අප්‍රේල් මස දී බද්ධ ව්‍යාපාර ගිවිසුමකට ඇතුළත් විය.

**1 · 18 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය**

**(1977 = 100)**

| කාර්මික ගණය | 1982 | 1983 | 1984(අ) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 83·6 | 73·6 | 56·7 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 135·7 | 127·0 | 141·2 |
| 3. දැව හා දැව නිෂ්පාදිත .. | 151·0 | 163·1 | 149·1 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 133·3 | 135·7 | 117·2 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 133·1 | 105·2 | 125·2 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත .. | 131·5 | 125·1 | 109·6 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 106·3 | 109·7 | 75·5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත .. | 96·3 | 76·8 | 86·2 |
| සියළුම කාර්මික ගණයන් .. | **124·6** | **106·7** | **113·8** |


(අ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මූර්ත වටිනාකම අනුව, 1983 දී සියයට 15 ක පහත වැටීමක් වාර්තා කළ රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්හි සමස්ත නිමැවුම 1984 දී සියයට 7 කින් ඉහළ ගියේය. මෙම ඉහළ නැගීම ප්‍රධාන වශයෙන්ම 1984 වර්ෂය තුළදී වසාතැබීම් කිසිවකට භාජනය නොවී ක්‍රියාත්මක වූ ඛනිජ තෙල් පිරිපහදුවේ නිමැවුමේ වූ සියයට 22 ක වැඩිවීම තුළින් ඇතිවූවකි. මෙම සංස්ථාව හැර අනෙකුත් රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන්හි නිමැවුමෙහි, සමාලෝචිත වර්ෂයේ දී, සියයට 8 ක අඩුවීමක් වාර්තා විය.

පසුගිය වර්ෂවලදී මෙන්ම මේ වර්ෂයේදී ද රාජ්‍ය සංස්ථාවල ක්‍රියාකාරිත්වයෙහි අසමානත්වයක් දක්නට ලැබුණි. නිමැවුමේ වැඩිවීම් පෙන්නුම් කළ සංස්ථාවන් වූයේ රාජ්‍ය ස්කාගාර (සියයට 32), ජාතික පේෂකර්ම (සියයට 19), රාජ්‍ය පොහොර නිෂ්පාදන (සියයට 12), ලංකා තුනී ලෑලි (සියයට 10) සහ රාජ්‍ය පතල් කැණීම් සහ ඛනිජ සංවර්ධන (සියයට 2) යන සංස්ථාවන්ය. ලංකා සම්භාණ්ඩ (සියයට 39), ලංකා වානේ (සියයට 31), රාජ්‍ය දැව (සියයට 27), ජාතික ලුණු (සියයට 23), ශ්‍රී ලංකා ටයර් (සියයට 19), ශ්‍රී ලංකා සීනි(සියයට 18), ශ්‍රී ලංකා සිමෙන්ති (සියයට 15), ජාතික කඩදාසි (සියයට 13), ලංකා තෙල් හා මේද (සියයට 12), පරන්තන් රසායන ද්‍රව්‍ය සහ ලංකා පිඟන් (සියයට 11 බැගින්) හා රාජ්‍ය ලෝහ භාණ්ඩ (සියයට 7) යන සංස්ථාවන් සහ ජාතික කිරි මණ්ඩලය (සියයට 11) නිමැවුමේ අඩුවීම් පෙන්නුම් කළේය.

# රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය




ශ්‍රී ලංකා මහ බැංකුව.

* ප්‍රධාන ව්‍යවසායයන් 26 යේ නිමැවුම් නියෝජනය කරයි.

## 1·19 සංඛ්‍යා සටහන

### කාර්මික ව්‍යවසායයනට කරන ලද රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1982—1984

රුපියල් දශ ලක්ෂ

| සංස්ථාව/ව්‍යවසායය | ප්‍රාග්ධන | | | වර්තන | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982 | 1983 | 1984(අ) | 1982 | 1983 | 1984(අ) | 1982 | 1983 | 1984(අ) |
| 1. ජාතික කිරි මණ්ඩලය .. .. | 10·7 | 9·0 | 7·5 | 45·9 | 21·3 | 25·1 | 56·6 | 30·3 | 32·6 |
| 2. ලංකා තෙල් සහ මේද .. .. | 10·9 | 25·3 | 99·1 | — | — | — | 10·9 | 25·3 | 99·1 |
| 3. ශ්‍රී ලංකා සීනි .. .. | 75·4 | 122·5 | 168·8 | — | — | 7·1 | 75·4 | 122·5 | 175·9 |
| 4. ජාතික පේෂකර්ම .. .. | — | 31·5 | 127·2 | — | 32·7 | — | — | 64·2 | 127·2 |
| 5. ජාතික කඩදාසි .. .. | — | — | 5·6 | 10·0 | — | — | 10·0 | — | 5·6 |
| 6. රාජ්‍ය රබර් නිෂ්පාදන .. .. | — | — | — | 0·7 | — | — | 0·7 | — | — |
| 7. රාජ්‍ය පොහොර නිෂ්පාදන .. .. | 300·0 | — | — | 543·0 | 494·7 | 537·3 | 843·0 | 494·7 | 537·3 |
| 8. ලංකා වානේ .. .. | — | 39·1 | — | — | — | — | — | 39·1 | — |
| 9. රාජ්‍ය ලෝහ .. .. | — | — | — | — | 0·4 | — | — | 0·4 | — |
| 10. ජාතික ඇඹුරුම් ද්‍රව්‍ය .. .. | — | — | — | 2·5 | 7·7 | 1·0 | 2·5 | 7·7 | 1·0 |
| 11. රාජ්‍ය මුද්‍රණ .. .. | — | — | 51·6 | — | — | — | — | — | 51·6 |
| 12. සීමාසහිත ලංකා ඔක්සිජන් .. .. | — | — | — | 2·6 | 8·7 | 6·1 | 2·6 | 8·7 | 6·1 |
| එකතුව .. .. | 397·0 | 227·4 | 459·8 | 604·7 | 565·5 | 576·6 | 1,001·7 | 792·9 | 1,036·4 |

(අ) තාවකාලික.

මූලය: මහා භාණ්ඩාගාරය.

මෙම නිපැයුම්හි පහත වැටීම් සඳහා බලපෑ හේතූන් විවිධාකාර විය. ලංකා වානේ සහ ජාතික කඩදාසි යන සංස්ථාවලට අමුද්‍රව්‍ය සැපයුමේ හිඟතාවයන් හේතුකරගෙන නිෂ්පාදන ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවිය. අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා දෙවැනි අස්වැන්න ලැබීම ප්‍රමාද වී පටන් ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජාතික ලුණු සංස්ථාවේ නිෂ්පාදනය පහත වැටුණි. අලෙවිකරන ප්‍රශ්න හේතුකොටගෙන සනීපාරක්ෂක භාණ්ඩ කම්හලේ තාවකාලික වසා දැමීම සහ විසිතුරු පිඟන් ගඩොල් හා නොවිකිරණ ද්‍රව්‍ය වැනි ඇතැම් භාණ්ඩ නිෂ්පාදනය සීමා කිරීම නිසා ලංකා පිඟන් සංස්ථාවේ නිමැවුම පහළ ගියේය. යාන්ත්‍රික දෝෂ හා තොග සංචලනය සෙමින් සිදුවීමත් නිසා පරන්තන් රසායන ද්‍රව්‍ය සංස්ථාවට නිෂ්පාදන කටයුතු සීමා කිරීමට සිදුවිය.

1983 වර්ෂය සමග සසඳනවිට 1984 වර්ෂයේදී, සංස්ථාවලින් බහුතරයක අලෙවි කටයුතු සතුටුදායක විය. ලැබී ඇති දත්තයන්ට අනුව, රාජ්‍ය ස්කාගාර, රාජ්‍ය පතල් කැණීම් සහ ඛනිජ සංවර්ධන, රාජ්‍ය ලෝහ භාණ්ඩ, ලංකා තෙල් හා මේද, ලංකා ඛනිජ වැලි, ලංකා සම්භාණ්ඩ, රාජ්‍ය දැව, ලංකා තුනී ලෑලි සහ ජාතික කඩදාසි යන සංස්ථා සිය අලෙවි ක්‍රියාකාරීත්වයේදී වර්ධනයක් පෙන්නුම් කළේය. ආනයනයන් හේතුකොටගෙන ඇතිවූ අලෙවි කිරීමේ ප්‍රශ්න ලංකා වානේ සංස්ථාවෙහි විකුණුම් කටයුතු කෙරෙහි අයහපත් ලෙස බලපෑවේය.

රාජ්‍ය ව්‍යවසායයන් වාණිජ ශක්‍යතාවයේ පදනම මත පවත්වාගෙන යාම කෙරෙහි, දැනට පවතින අවධාරණයේ ප්‍රතිඵලයක් වශයෙන් 1984 වර්ෂයේදී බොහෝ සංස්ථා ලාභ පෙන්නුම් කරන ලදී. මේවා අතුරින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් 171 කෝටි 70 ලක්ෂයක මෙතෙක් නොවූ විරූ ආකාරයේ ලාභයක් ලැබීය. මෙම සතුටුදායක ක්‍රියාකාරීත්වයට හේතු වූයේ බොර තෙල් මිළ පහත බැසීම සහ 1983 දී අභ්‍යන්තර මිළ ගණන්වල ඇතිවූ වැඩිවීමයි. 1984 වර්ෂයේ දී ලාභ වාර්තා කළ රාජ්‍ය අංශයේ සෙසු ව්‍යවසායයන් අතර, ජාතික ලුණු, ලංකා සම්භාණ්ඩ, රාජ්‍ය ස්කාගාර, රාජ්‍ය දැව, ජාතික කඩදාසි, ලංකා ඛනිජ වැලි හා රාජ්‍ය පතල් කැණීම් සහ ඛනිජ සංවර්ධන යන සංස්ථා විය. ලංකා වානේ, රාජ්‍ය ලෝහ භාණ්ඩ, ශ්‍රී ලංකා සීනි හා රාජ්‍ය පොහොර නිෂ්පාදන යන සංස්ථාවන් සමාලෝචිත වර්ෂයේදී ද මූල්‍යමය අලාභයන් පෙන්නුම් කරන ලදී. මීට අමතරව, පසුගිය වර්ෂයේදී ලාභයක් වාර්තා කළ ලංකා පිඟන් සංස්ථාව, 1984 වර්ෂයේදී අලාභයක් පෙන්නුම් කළේය. යන්ත්‍රසූත්‍ර ක්‍රියා විරහිතවීම්, අමුද්‍රව්‍ය හිඟතා, පුහුණු සේවකයින්ගේ ඌනතා සහ කාරක ප්‍රාග්ධනයේ අප්‍රමාණවත් බව වැනි මූල්‍යමය අවහිරතා යනාදී කරුණු මෙම සංස්ථාවල ක්‍රියාකාරීත්වයේ අසතුටුදායක ප්‍රතිඵලවලට පොදු හේතූන් විය.

1984 දී රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයනට කරණු ලැබූ රජයේ සංක්‍රාම ගෙවීම් රුපියල් 103 කෝටි 60 ලක්ෂයක් විය. එය රුපියල් 46 කෝටියක ප්‍රාග්ධන සංක්‍රාමයන්ගෙන් සහ රුපියල් 57 කෝටි 60 ලක්ෂයක වර්තන සංක්‍රාමයන්ගෙන් සමන්විත විය. ශ්‍රී ලංකා සීනි, ජාතික පේෂකර්ම, ලංකා තෙල් සහ මේද, රාජ්‍ය පොහොර නිෂ්පාදන, යන සංස්ථා සහ ජාතික කිරි මණ්ඩලය මෙම සංක්‍රාම ලැබූවන් අතර ප්‍රධාන විය.

**ආයෝජන ප්‍රවර්ධන කලාපය**

මහ කොළඹ ආර්ථික කොමිසම (ම. කො. ආ. කො.) විසින් 1984 දී ව්‍යාපෘතීන් 15 ක් අනුමත කරනු ලැබූ අතර, 1984 වසර අවසන් වන විට අනුමැතිය ලත් ව්‍යාපෘතීන් ගණන 199 ක් විය. මේවායින් ව්‍යවසායයන් 112 ක් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම සමග ගිවිසුම් අත්සන් කොට තිබිණ. වාණිජමය නිෂ්පාදන කටයුතුවල නියුතු ව්‍යවසායයන් 74 න් (මේවායින් 62 ක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ) 32 ක් මසා නිම කළ ඇඳුම් නිෂ්පාදනයේ නියැලුණි. 1983 දෙසැම්බර් අග වන විට සේවයේ යෙදුනු 26,053* සමග සැසඳීමේදී 1984 දෙසැම්බර් අවසානයේ දී මහ කොළඹ ආර්ථික කොමිසමෙහි සේවයේ නියුතු මුළු සංඛ්‍යාව 29,251* ක් විය. ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ මසා නිමකළ

* එයාර් ලංකා සමාගමේ සේවකයින් හැර.

ඇඳුම් අංශයේ නියැළුණු ව්‍යාපෘතීන් ගණන වැඩි වුවද, ඉකුත් වසර කිහිපය තුළදී අනුමැතිය ලත් ව්‍යාපෘතීන් දෙස බලන විට, කාර්මික කටයුතු ඉතා පුළුල් අන්දමින් විවිධාංගිකරණය කෙරෙහි සතුටුදායක නැඹුරුවක් පෙන්නුම් කරයි.

1984 වර්ෂයේ දී අනුමත කරන ලද ව්‍යාපෘතීන් පහළොව, රෙදිපිළි හා අන් තැනෙක සඳහන් නොවූ නිමැවුම් කර්මාන්තයන්හි හතර බැගින් ද, සකස් කළ ලෝහ නිෂ්පාදිතයන්හි තුනක් ද, සේවා අංශයෙහි දෙකක් ද, රසායන නිෂ්පාදිත සහ ද්‍රව සහ ද්‍රව නිෂ්පාදිතයන්හි එක බැගින් ද සමන්විත විය. ඇඳුම්, ක්‍රීඩා භාණ්ඩ, රබර් පදනම් වූ නිෂ්පාදිත, සුවඳ විලවුන් වර්ග, සැහැල්ලු ඉංජිනේරු නිෂ්පාදිත, විද්‍යුත් උපකරණ සහ විදුලි උපකරණ වැනි විවිධ නිෂ්පාදිතයන් අපනයනය කිරීම සඳහා යොමුවේ.

1984 දී මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යවසායයන්ගෙන් ලත් දළ අපනයන ඉපැයීම් ප්‍රමාණය රුපියල් 111 කෝටි 90 ලක්ෂයකින් (විගැහි 4 කෝටි 90 ලක්ෂයකින්) හෙවත් සියයට 46 කින් වැඩි විය. ඉකුත් වසරේදී මෙන්ම 1984 වර්ෂයේ දී ද මුළු ඉපැයුම් වලින් වැඩි ගණනක් (සියයට 50 ක්) ඇඳුම් පැළඳුම් සහ පාවහන් අංශයේ අපනයන ඉපැයීම් විය. මෙම අංශයේ ඒක පුද්ගල අපනයන ඉපැයීම් විගැහි වටිනාකම් අනුව සියයට 30 කින් වැඩි විය. අපනයන ඉපැයීම්හි වැඩිවීම් වාර්තා කරනු ලැබූ අනෙකුත් අංශයන් වූයේ පාන වර්ග සහ දුම්කොල නිෂ්පාදිත, වානේ සහ සකස් කළ ලෝහ නිෂ්පාදිත සහ ප්ලාස්ටික් නිෂ්පාදිතයන් ය.

අක්කර 450 කින් යුත්, මහ කොළඹ ආර්ථික කොමිසමට අයත් දෙවන ආයෝජන ප්‍රවර්ධන කලාපය වන බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ඉදිකිරීම් කටයුතු දැනට සිදුවෙමින් පවතී. 1985 දී නිමැවුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇති මෙම කලාපයේ යටිතල පහසුකම්, කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පහසුකම් වලට සමාන වනු ඇත.

**1 . 20 සංඛ්‍යා සටහන**

**ආයෝජන ප්‍රවර්ධන කලාපය – සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1983 – 1984**

| කර්මාන්තය | 1983 | | 1984 (අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) ගණන | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) ගණන | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 30 | 41.7 | 30 | 116.0 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත | 22,389 | 1,917.4 | 25,041 | 2,889.1 |
| 3. දැව හා දැව නිෂ්පාදිත .. | 64 | 1.6 | — | 0.1 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | — | — | — | — |
| 5. රසායන ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 760 | 108.6 | 1,652 | 136.3 |
| 6. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත .. | 85 | 5.6 | — | 2.7 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | — | — | — | — |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ .. | 606 | 92.6 | 234 | 85.8 |
| 9. අනෙකුත් නිෂ්පාදිත .. | 1,762 | 81.4 | 1,934 | 108.0 |
| 10. සේවා † .. | 357 | 170.0 | 360 | 199.4 |
| එකතුව .. | 26,053 | 2,418.9 | 29,251 | 3,537.4 |

† එයාර් ලංකා සමාගම හැර

(අ) තාවකාලික.

මූලය: මහ කොළඹ ආර්ථික කොමිෂම.